**තලවාකැලේ ලිඳුල නගර සභාව - 2022**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

තලවාකැලේ ලිඳුල නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට තලවාකැලේ ලිඳුල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය

සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.2 (අ) ඡේදයේ නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පනවන ලද නඩු 13 ක් පිළිබඳ තොරතුරු ගිණුම සමඟ හෙලිදරව් කර නොතිබුණි. | තොරතුරු ඉදිරියේදී ඉදිරිපත් කරන බව හා නඩු 06ක් පිළිබඳ විස්තර මෙම පිළිතුර සමඟ ඉදිරිපත් කරන බව | මූල්‍ය ප්‍රකාශනවල නඩු පිළිබඳව හෙලිදරවු කිරීම් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට සභාව සතු බැංකු ගිණුම් 02 කට අදාළව පැවති අගරු චෙක්පත් වටිනාකම රු. 742,107 ක් මුදල් ගිණුම් සංශෝධනය නොකර අගරු චෙක්පත් ගිණුමට හරකර තිබුණ ද එය සමාලෝචිත වර්ෂයේ ද නිවැරදි කර නොතිබුණි. | අදාළ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කරන බව | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයකට අදාළ ගිණුම්ගත නොකළ ලැබිය යුතු මුද්දර ගාස්තු රු.952,500 ක් සමාලෝචිත වර්ෂය තුළ ලැබීමේදී සමුච්චිත අරමුදලට බැර කිරීමකින් තොරව ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුමට බැර කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම් ශේෂය ඉක්මවා ලැබී තිබුණු රු.5,204,100 ක මුද්දර බදු හා ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.1,259,000 ක තානායම් කුලී සමුච්චිත අරමුදලට ගැලපීම් කර නොතිබුණි. | මෙම ගිණුම්කරණ අඩුපාඩු ඉදිරි මුදල් ප්‍රකාශ සකස් කිරීමේදී නිවැරදි කරන බව | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අපහරණය කරන ලද වත්කම් ඒකක 101 ක්ද, වෙන්දේසි කරන ලද භාණ්ඩ 19 ක පිරිවැය වටිනාකම හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කර නොතිබුණු අතර මිළ සඳහන් නොවූ පුස්තකාල පොත් 1714 ක් කසළ අංගනයේ තිබුණු කාබනික පොහොර තොගයේ වටිනාකමද හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ නිවැරදි කරන බව | ගිණුම්වලින් වටිනාකම් ඉවත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ බැංකුවට සෘජුවම බැර කරන ලද රු.119,000 ක් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | සෘජු බැරකිරීම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ලැබිය යුතු සේ සලකා ඇස්තමේන්තු කර ගිණුම්ගත කළ උසාවි දඩ ආදායම හා ලැබීම් අතර වෙනස සමුච්චිත අරමුදලට ගැලපීමකින් තොරව ලැබිය යුතු ශේෂයක් ලෙස එකතුව රු.4,998,832 ක් දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී වැරදි නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදිව දැක්විය යුතුය. |
| (උ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂ තුළ රු.1,293,013 ක් සහ ලී බඩු හා සවිකිරීම් තුළ රු.2,580,980 ක් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ඇතුළත් වී තිබුණු අතර සභාව සතුව නොමැති රු.98,700 ක ජල බවුසරයක්, මූල්‍ය ප්‍රකාශනයේ දැක්වීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු.3,972,693 ක් වැඩියෙන් දැක්විණි. | 2023 මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දි නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගය දැක්විය යුතුය. |
| (ඌ) | රු.240,700 ක මුළුතැන්ගෙයි උපකරණ 14 ක්ද, පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ලැප්ටොප්, ප්‍රින්ටර්, ස්කැනර් ආදී භාණ්ඩ 45 ක, වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මෙම තොරතුරු නිවැරදිව ලබාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදි අගය දැක්විය යුතුය. |
| (එ) | ඉකුත් වර්ෂ දෙකකට අදාලව ගෙවන ලද රු.437,036 ක විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | මෙම විමසුමෙන් පෙන්වා දී ඇති රු.437,036 මුදල 2022 වර්ෂයේ ගෙවා ඇති බව | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගයන් දැක්විය යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 07 කට අදාළ මූලික පොත් ශේෂයන් සමඟ සැසැඳීමේදී රු.5,064,536 ක නොසැසඳීමක් විය. | ශේෂයන් නිවැරදිව සසඳා ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.6,988,777 ක් වටිනා ගිණුම් ශේෂ 13 ක් උපලේඛන හා කාලවිශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | අඩුපාඩු මේ වන විට සකස් කරගෙන යමින් පවතින බව. | උපලේඛන සකස් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. | මු.රෙ. 371 (ආ) | අවස්ථා 05 කදී ලබාදී තිබුණු රු. 403,000 ක අත්තිකාරම් මාස 03 සිට අවුරුදු 02 දක්වා කාලයක සිට පියවා නොතිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. | මු.රෙ. 189 හා 486 | අගරු චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| iii. | මුදල් රෙගුලාසි 571(3) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාලය ඉකුත් වූ රු. 374,734 ක පොදු තැන්පත් ශේෂ 15 ක් නියාදනය කර නොතිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | | |
| | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය | වරිපනම් බදු දේපල වසර 05 කට වරක්වත් තක්සේරු කළ යුතු වුවද, 2011 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් බදු අය කර තිබුණි. | නිවැරදිව තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,345,147 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,578,700 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම හා බදු | 6,780,000 | 6,724,918 | 6,148,583 | 3,881,965 | 6,570,770 | 7,049,655 | 6,551,121 | 3,305,630 |
| (ii) | කඩ කුලී | 10,045,040 | 11,805,249 | 11,338,817 | 6,034,029 | 7,503,540 | 9,843,300 | 8,419,321 | 5,567,597 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 895,000 | 594,000 | 594,000 | - | 2,005,500 | 723,000 | 946,250 | - |
| (iv) | වෙනත් ආදායම් | 59,801,720 | 7,500,000 | 8,597,808 | 5,493,232 | 60,026,540 | - | 43,517,272 | 6,591,040 |
| | | 77,521,760 | 26,624,167 | 26,679,208 | 15,409,226 | 76,106,350 | 17,615,955 | 59,433,964 | 15,464,267 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු | | |
| | 2010 වර්ෂයේ සිට 2017 වර්ෂ සඳහා අයවිය යුතු හිඟ වරිපනම් බදු රු.2,121,128 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයවී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම හිඟය රු.4,679,130 දක්වා වර්ධනය වී පැවතුණි. | හිඟ වරිපනම් අයකිරීම සඳහා දේපළ තහනම් කිරීම හා ජංගම සේවා වැඩ සටහන් සකස් කරමින් පවතින බව | හිඟ ආදායම් අය කළ යුතුය. |
| (ආ) | කුලී | | |
| i | පොදු වෙළඳපොලට අයත් කඩ කාමර 03 කින් 2016 හා 2017 වර්ෂවල සිට රු.100,396 ක කඩ කුලී හිඟයක් පැවති අතර සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟය රු.617,885 ක් දක්වා වර්ධනය වී තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු සිදුකර නව බදුකරුවකු තෝරාගෙන එය බදු දිම සඳහා කටයුතු කරන බව | හිඟ ආදායම් අයකළ යුතු අතර කඩ කාමර බදුදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii | නිළධාරියෙකුගෙන් අයවිය යුතු 2013 වර්ෂයේ සිට පැවත එන රු.192,600 ක ගෙවල් කුලී අයකර නොතිබුණි. | කුලී හිඟ ආදායම් සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත ලිඛිතව දැනුම් දී ඇති බව . | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>------------------------------- | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.4,998,832ක් හා මුද්දර ගාස්තු රු.494,400 ක් විය. | අදාල ආයතන සඳහා ලිපි යොමු කර ඇති බව | ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 104 හා 127 (ආ) ඡේදය අනුව සමාලෝචිත වර්ෂය තුළ පොදු කාණු ඉදිකිරීම හෝ කාණු පද්ධති හා පොදු නාන ස්ථාන අළුත්වැඩියාවන් හෝ සිදුකර නොතිබුණි. | සභා අරමුදලින් කර්මාන්ත ඉටු කිරීමට නොහැකි වූ බව | පනතේ සඳහන් කාර්යයන් ඉටුකළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තානායම් කුලී ආදායම් ලෙස ලැබී අගරු වී තිබුණු 2021 මැයි 10 දිනැති රු.100,000 ක චෙක්පත සම්බන්ධ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව | ආදායම් රැස් කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2003 සිට 2021 දක්වා කාලයට අදාළ කර්මාන්ත ණයගැති ශේෂ එකතුව රු.11,783,220 ක් හා කර්මාන්ත ණයහිමි එකතුව රු.12,179,252 ක ශේෂය නිරවුල් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා සීමාව තුළ අනවසර ඉදිකිරීම් 219 ක් නිරීක්ෂණය වූ අතර නගර සභාවට අයත් තානායම පිහිටි භූමියේ වර්ග අඩි 3000 කට අධික | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සොයා බලා මේ වන විට ඒවා ඉවත් කිරීමට කටයුතු කරගෙන | අනවසර ඉදිකිරීම් ඉවත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රමාණයක ස්ථිර ගොඩනැගිල්ලක් අනවසරයෙන් ඉදිකර තිබුණි. ධර්මලිංගම් සංස්කෘතික ශාලා භූමියේ අනවසරයෙන් ගොඩනැගිල්ලක් ඉදිකර විදුලිය දුරකථන පහසුකම්ද සපයාගෙන තිබුණි. | යමින් පවතින බව | |

## 3.4 නිෂ්කාර්ය ඌන උපයෝජිත දේපල පිරියත, හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති එකතුව රු.17,280,286 ක යන්ත්‍ර, ලී බඩු හා කාර්යාල උපකරණ ඒකක 327 ක් හා වාහන 07 ක් වසර 02 සිට වසර 10 දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි. | සමීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති අතර එම නිරික්ෂණ ලැබීමෙන් පසුව ක්‍රියාමාර්ග ගන්නා බව | අළුත්වැඩියා කර උපයෝජනය කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ තබා තිබුණු පැරණි හලර් යන්ත්‍රයේ ධාවන මෝටරය ගලවා ඉවත් කර තිබුණු අතර එම යන්ත්‍රය දිරාපත් වෙමින් පැවතුණි. | මෙම යන්ත්‍රය ඉදිරියේදි වෙන්දේසි කිරීමට කටයුතු කර සභාවට ආදායමක් ලැබෙන පරිදි කටයුතු කරන බව | මෝටරය ගලවා ඉවත් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් කල යුතු අතර උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ගබඩාවේ රු.54,635 ක තොග ඒකක 217 ක ඌණතාවයන් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නැවත සමීක්ෂණය කර ඌණතා හා අතිරික්ත නිවැරදි කිරීමට කටයුතු කරන බව | ඌණතා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ටෙන්ඩර් පරිපාටියකින් තොරව දෙව්සිරිපුර සේවා පියස ගොඩනැඟිල්ලේ බිම් මහල පෞද්ගලික පෙර පාසලක් පවත්වාගෙන යාම සඳහාද, තලවාකැලේ පෙර පාසල, කායවර්ධන මධ්‍යස්ථානයක් වශයෙන් පවත්වාගෙන යාම සඳහාද, බාහිර පාර්ශවයන්ට මාසික කුලියක් මත පිළිවෙලින් වසර තුනක් හා හයක කාලයකට බදු දී තිබුණි. | මහා සභාවේ තීරණය මත බදු පදනම මත ලබා දී ඇති බව. | රීති ප්‍රකාරව ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර බදු දිය යුතුය. |
| (ආ) | සභාව සතු තානායම සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වසරක කාලයට බදු දීමට ටෙන්ඩර් කැඳවා ටෙන්ඩර්කරුවෙකු තෝරාගෙන පසුව අනුමැතියකින් තොරව වසර 10 ක කාලයක් දක්වා බදු කාලය දීර්ඝ කර බදුකරු සමඟ ගිවිසුම් ගතවී තිබුණි. | පෙර සභාපතිවරයාගේ පෞද්ගලික කැමැත්ත මත වසර 10 ක කාලයක ගිවිසුම් ගතවී ඇති බව | කටයුතු විධිමත් කළ යුතුය. |

### 3.7 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.956,750 ක ඇස්තමේන්තුවක් මත ගුණානන්දපුර කානුව ඉදිකිරීම සඳහා 2022 මාර්තු 07 දින තලවාකැලේ එකමුතු සමෘද්ධි සමිතිය සමඟ ගිවිසුම්ගත වී තිබූ අතර 2022 මැයි 08 දිනට ප්‍රථම කර්මාන්තය නිම කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිටත් කර්මාන්තය නිම කිරීමට කටයුතු කර නොතිබුණි. 2022 මාර්තු 21 දින රු.191,350 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා එම අත්තිකාරම පියවා ගෙන නොතිබුණි. මෙම කර්මාන්ත ඉටු නොකිරීම නිසා දැඩි බෑවුම් සහිත ප්‍රදේශයක සිට ගලායන ජලය අසල පිහිටි නිවාසවල ආරක්ෂාවටද තර්ජනයක් වී තිබුණි. | කර්මාන්ත ඉටු කිරීම සඳහා ලබා දී ඇති රු.191,350.00 ක අත්තිකාරම් මුදල සභාවට නැවත ගෙවන ලෙස දන්වා ඇති බව | ඉදිකිරීම් කටයුතු ඇස්තමේන්තු ප්‍රමිතියට ඉටු කරවාගත යුතු අතර අත්තිකාරම් පියවා ගත යුතුය. |

### 3. 8 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාම ගොස් තිබුණු ස්ථාන මාරු වී ගිය හා නිළධාරියෙකුගේ හා සෞඛ්‍ය කම්කරුවන් තිදෙනකුගේ සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වසර 01 සිට වසර 10 ක පමණ කාල පරාසයකට අදාළ රු.396,478 ක ණය ශේෂයක් අයකරගෙන නොතිබුණි. | ණයශේෂ අය කර ගැනීමට කටයුතු කරන බව | විශ්‍රාම ලිපි නිවැරදි කර අවසන් හිඟ ශේෂ අයකළ යුතුය. |
| (ආ) | විශ්‍රාම ගොස් සිටි කම්කරුවන් තිදෙනකුගේ විශ්‍රාම වැටුප් ලිපි ගොනුවල අවශ්‍යතා සම්පූර්ණ නොකිරීම හේතුවෙන් වසර 10 ක් ඔවුන්ට විශ්‍රාම වැටුප් අහිමි කර තිබුණි. | ණයශේෂ අය කර ගැනීමට කටයුතු කරන බව | විශ්‍රාම ලිපි නිවැරදි කර අවසන් හිඟ ශේෂ අයකළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම මේ වනවිට සකස් කරමින් පවතින බව | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාවක් හෝ පාලන වාර්තාවක් සකස් කර නොතිබුණි. | අදාළ වාර්තා සකස් කරමින් පවතින බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 16 සිට සියයට සියය ඉක්මවා වියදම් විෂයයන් 07 ක සියයට 10 සිට සියයට සියය ඉක්මවා විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂය සඳහා අයවැය සකස් කිරීමේදී තාත්වික අයවැයක් සකස් කිරීමට කටයුතු කරන බව | අවශ්‍යතාවය හඳුනාගෙන අවධානයෙන් අයවැය පිළියෙල කළ යුතුය. |

### 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බල ප්‍රදේශයේ දිනකට කසල ටොන් 01 ක් එකතු කර තිබුණද, දිරන සහ නොදිරන කසල වෙන් කිරීමකින් තොරව අවිධිමත්ව ආදාහනාගාරයට යාබද ස්ථානයකට කසල බැහැර කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | කාබනික පොහොර නිෂ්පාදනයට යොමු විය යුතුය. |

### 4.4 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක පිහිටුවාගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා තිරසර සංවර්ධන ඉලක්ක මේ වනවිට සකස් කරමින් පවතින බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |